නිපුණතා පාදක විෂය නිර්දේශය

# මූලික පිරිවෙණ

**3,4,5 ශ්‍රේණි**

# භූගෝල විද්‍යාව

**(2017 සිට ක්‍රියාත්මක වේ)**

පිරිවෙන් අධ්‍යාපන ශාඛාව

අධ්‍යාපන අමාත්‍යාංශය - ඉසුරුපාය - බත්තරමුල්ල

භූගෝල විද්‍යාව

03, 04, 05 ශ්‍රේණි

මූලික පිරිවෙන් නිපුණතා පාදක නව විෂය නිර්දේශය

ප්‍රථම මුද්‍රණය - 2016
මුද්‍රණය සහ බෙදාහැරීම
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

පිරිවෙන් අධ්‍යාපන ශාඛාව
අධ්‍යාපන අමාත්‍යාංශය
ඉසුරුපාය, බත්තරමුල්ල.

වෙබ් අඩවිය : www.Moe.gov.lk / pirivena
විද්‍යුත් තැපැල : piriven@moe.gov.lk

හෝමාගම, කටුවාන පාර, කාර්මික ජනපදයේ අංක 67හි පිහිටි
සී/ස කරුණාරත්න සහ පුත්‍රයෝ (පුද්ගලික) සමාගමෙහි
මුද්‍රණය කරන ලදි.

# පිරිවෙන් අධ්‍යාපන අධ්‍යක්ෂ නාහිමිපාණන්ගේ පණිවුඩය.

ලෝකයේ දියුණු නොදියුණු සෑම රටක ම කලින් කලට අධ්‍යාපනයට අදාළ නව විෂය නිර්දේශ හඳුන්වා දීම හෝ පවත්නා විෂය නිර්දේශ සංස්කරණය කිරීම කරනු ලබයි. මෙමගින් විෂය නිර්දේශයේ අන්තර්ගතය කාලීන අවශ්‍යතාවන්ට ගැළපෙන පරිදි සකස්කර ගැනීමටත් විෂය නිර්දේශය නව ආකෘතියකින් ඉදිරිපත් කිරීම මගින් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය වඩාත් පහසු හා සාර්ථක කරගන්නටත් අවස්ථාව සැලසේ.

අනූව දශකයේ දී ජාතික අරමුණු නවයක් හා පොදු නිපුණතා පහක් සාක්ෂාත් කර ගැනීම ඉලක්ක කොට ගෙන විෂය නිර්දේශ ප්‍රතිසංස්කරණය කරනු ලැබිණ. මෙම සහස්‍රයේ විෂය නිර්දේශ සකස් කිරීමේ දී යොදා ගන්නා ලද්දේ නිපුණතා පාදක ක්‍රමයයි. මෙම ක්‍රමය පාසල් අධ්‍යාපනයට හඳුන්වා දී දැනට වසර කීපයක් ම ගත වී හමාරයි. ඒ අනුව නවීන අධ්‍යාපන ක්‍රමවේදයක් වන නිපුණතා පාදක ඉගැන්වීම් ක්‍රමය පිරිවෙන් අධ්‍යාපන ක්ෂේත්‍රයට ද හඳුන්වා දීම අපේ අරමුණයි. පහත දැක්වෙන්නේ නිපුණතා පාදක ක්‍රමය පිළිබඳ පිළිගත් විග්‍රහයකි.

"කිසියම් විෂය ක්ෂේත්‍රයකට අදාළ අත්‍යවශ්‍ය විෂය කරුණු, මූලධර්ම හා ක්‍රම ශිල්ප ප්‍රායෝගික ආකාරයෙන් සුසංයෝගී ලෙස යොදා ගැනීමේ හැකියාව නිපුණතාවයි".

(අධ්‍යාපන විශ්වකෝෂය)

සැකෙවින් කිවහොත් නිපුණතාවක් යනු දැනුම, ආකල්ප, කුසලතා හා අන්තර් පුද්ගල හැකියා ඒකරාශී වී ගොඩ නැගෙන ජීවිත පුරුද්දකි. ධනාත්මක ජීවිත පුරුදු ඇති කිරීම නිපුණතා පාදක විෂය නිර්දේශයක අරමුණයි.

නිවැරදි, පැහැදිලි හා විධිමත් විෂය නිර්දේශයක් ගුරුවරයාටත් ශිෂ්‍යයාටත් එක සේ වැදගත් වෙයි. විෂය නිර්දේශයෙන් පෙන්වා දෙන මාර්ගයේ ශිෂ්‍යයා කැඳවා ගෙන යාම ගුරුවරයාගේ කාර්යයි. එම ගමන නිමා විය යුත්තේ ශිෂ්‍යයා විසින් ඉගෙනුම් පල අත්පත් කර ගැනීමෙනි. එවිට ශිෂ්‍යයාට මෙන් ම ගුරුවරයාට ද ඉගෙනුම් පල දැකීමෙන් සතුටට පත්විය හැකි ය.

කලකට පෙර පිරිවෙන් අධ්‍යාපනයට ම ආවේණික වූ විෂය නිර්දේශයක් විය. එහෙත් කාලයත් සමඟ පිරිවෙන් විෂය නිර්දේශය පාසල් විෂය නිර්දේශය තුළ නිමග්න වී ඇතුවා සේය. මේ නිසා ගිහි ශිෂ්‍යයාගේ අරමුණු හා ආකල්ප පැවිදි ශිෂ්‍යයාට ද නිරායාසයෙන් උරුම වෙමින් පවතී. ඒ හේතුවෙන් පැවිදි ශිෂ්‍යයා තමන්ට අදාළ ඉලක්ක වෙනුවට ගිහි ශිෂ්‍යයාගේ ඉලක්ක කරා ගමන් කිරීමෙන් ගමන නිමාවන බවක් දක්නට ලැබෙයි. මේ තත්ත්වය මත පාසල් අධ්‍යාපනයට අදාළ වූ විෂයයක් වුවද පිරිවෙණේ ඉගැන්විය යුත්තේ පැවිද්දාට අදාළ ආකල්ප හා කුසලතා වර්ධනය කරවන පිරිවෙණට ම ආවේණික විෂය නිර්දේශයක් ඔස්සේ ය.

මේ තාක් ලෝකයේ අධ්‍යාපන අරමුණු ප්‍රධාන වශයෙන් ඉලක්ක ගත වී පැවතියේ භෞතික දියුණුව සාර්ථක කර ගනු පිණිස ය. එහෙත් දියුණු ලෝකයේ රටවල් මේ වන විටත් එහි අනිසි විපාක අත් විඳිමින් සිටින බැවින් අනාගත ලෝකයේ අධ්‍යාපනික අරමුණු සකස් වෙමින් පවත්නේ භෞතික දියුණුව මෙන් ම ආධ්‍යාත්මික ශික්ෂණය ද අරමුණු කොටගෙන ය. එබැවින් පිරිවෙන් අධ්‍යාපන විෂය නිර්දේශ මගින් එකී අවශ්‍යතාව ඉටුකර ගැනීම අපගේ අරමුණයි.

මහාචාර්ය නාබිරිත්තන්කඩවර ඤාණරතන හිමි
අධ්‍යාපන අධ්‍යක්ෂ (පිරිවෙන්)

# අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්තුමාගේ පණිවුඩය

ශ්‍රී ලංකාව තුළ බුද්ධ ධර්මය ස්ථාපිත වීමත් සමග ම විහාරාරාම ගොඩනැංවීම ආරම්භ විය. දිවයිනේ ප්‍රධාන විහාරස්ථාන කේන්ද්‍ර කර ගනිමින් "පිරිවෙණ" නමැති විද්‍යායතනය බිහි විය. පැවිදි ගිහි දෙපක්ෂයට ම අවශ්‍ය වූ කලා ශිල්ප, භාෂා හා සමය සමයාන්තර ඥානයත්, යහපත්, ගුණගරුක සමාජයක් බිහි කිරීමට අවශ්‍ය සාරධර්ම අධ්‍යාපනයත් බෙදා දුන්නේ පිරිවෙණ මගිනි. එම සාම්ප්‍රදායික අනන්‍යතාව රැක ගනිමින් ම, කාලීන අවශ්‍යතා ද සපුරාලමින් යහපත් සමාජයක් ගොඩනැගීමේ කාර්යය ඉදිරියට ගෙන යාමට පිරිවෙණ ඉටු කරන කාර්ය භාරය සුළු කොට තැකිය නොහැකි ය.

පිරිවෙණේ අධ්‍යාපනය ලබන පැවිදි ගිහි සිසුන්ගේ ඉගෙනුම් ක්‍රියාවලිය වඩාත් ඵලදායී කිරීමට සහ පරිවේණාචාර්යවරුන්ගේ ඉගැන්වීම් ක්‍රියාවලිය ගුණාත්මක ව සංවර්ධනය කිරීමට 2017 වර්ෂයේ සිට ක්‍රියාත්මක කෙරෙන නව විෂය නිර්දේශ මුද්‍රණය කර ප්‍රථම වරට ලබා දීමට හැකිවීම ඉමහත් සතුටකි.

අයි. එම්. කේ. බී. ඉලංගසිංහ
අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
ඉසුරුපාය
බත්තරමුල්ල
2016.12.14

# විෂය නිර්දේශ කමිටුව

- **උපදේශකත්වය හා අනුමැතිය** - අධ්‍යාපන අධ්‍යක්ෂ (පිරිවෙන්)
  මහාචාර්ය පූජ්‍ය නාබිරිත්තන්කඩවර ඤාණරතන හිමි,
  පිරිවෙන් අධ්‍යාපන ශාඛාව,
  අධ්‍යාපන අමාත්‍යාංශය.

- **විෂය විශේෂඥ උපදේශනය**
  මහාචාර්ය යූ. ඒ. චන්ද්‍රසේන - භූගෝල විද්‍යා අධ්‍යයනාංශය,
  සමාජ විද්‍යා පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය.

  ආචාර්ය ඒ. ජී. අමරසිංහ - කථිකාචාර්ය, භූගෝල විද්‍යා අධ්‍යයනාංශය,
  කැලණිය විශ්වවිද්‍යාලය.

  එම්. පී. රංජනී ධනවර්ධන - අධ්‍යක්ෂ, සමාජවිද්‍යා දෙපාර්තමේන්තුව,
  ජාතික අධ්‍යාපන ආයතනය.

- **විෂය සම්බන්ධීකරණය**
  ජයසේන ගුණවර්ධන - විෂය උපදේශක (පිරිවෙන්),
  පිරිවෙන් අධ්‍යාපන ශාඛාව,
  අධ්‍යාපන අමාත්‍යාංශය.

- **ලේඛක මණ්ඩලය**
  ඩබ්. ඒ. එම්. සරත් චන්ද්‍රසිරි වික්‍රමසිංහ - කථිකාචාර්ය,
  සීතාවක පිරිවෙන් ගුරු අභ්‍යාස ආයතනය,
  අවිස්සාවේල්ල.

  ඩබ්. එන්. චමින්ද - පරිවේණාචාර්ය,
  සුභද්‍රාරාම විද්‍යායතන පිරිවෙණ, නුගේගොඩ.

  ආර්. එස්. ඒ. කේ. විජේරත්න - ගුරු උපදේශක, විද්‍යාකීර්ති මහපිරිවෙණ, හඟුරන්කෙත.

  කේ. ජී. තරංග දිනේෂ් කුමාර - පරිවේණාචාර්ය, ශ්‍රී විමලජෝති මහපිරිවෙණ,
  කඹුරුපිටිය.

  එච්. පී. කපිල විජේසිංහ - ගුරු උපදේශක, ශ්‍රී ධර්මරාජ මහපිරිවෙණ, කුලියාපිටිය.

- **පරිගණක තාක්ෂණික සහය**
  ක්‍රිෂ්නි සමුද්‍රිකා නවරත්න - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
  ධනුෂිකා නිමන්ති ගුණවර්ධන

- **පිටකවර නිර්මාණය**
  පී. ඒ. ශයිනි ඉමල්ෂා විජේවර්ධන - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

# විෂය හැඳින්වීම

තමා මෙන් ම තමා අවට ලෝකය ගැන දැන ගැනීම අප හැම දෙනාට ම අත්‍යවශ්‍ය දෙයකි. තමා ගැන දැන ගැනීම, අභ්‍යන්තර ලෝකය දැන ගැනීමයි. හඳුනා ගැනීමයි. තමා අවට ලෝකය දැන ගැනීම, බාහිර ලෝකය දැන ගැනීමයි, හඳුනා ගැනීමයි. භික්ෂූන් වහන්සේලාට බුදුරජාණන් වහන්සේගේ නිබඳ, නිරතුරු, අවවාදය වී ඇත්තේ සතිමත් ව, අවධිමත් ව, ජීවත් වීමයි. තමා අවට පරිසරය හෙවත් තමා අවට ලෝකය යනු සමස්ත විශ්වයම ය. සමස්ත විශ්වය පුරා ජීවත්වන සියලු සතුන් වෙත මෙත් වඩන්න යනු ද සම්බුද්ධ දේශනයයි. විශ්වය හඳුනාගෙන ජීවත් වීම අද අත්‍යවශ්‍ය ම දෙයකි. මෙම අභිලාශයන්ට අනුගතව අපේ පිරිවෙන්වල අධ්‍යාපනය ලබන පොඩි හාමුදුරුවරුන්ට අදළ නව විෂය නිර්දේශය, නිපුණතා හා නිපුණතා මට්ටම්වලට අනුව සකස් කර ඇත.

භික්ෂුවට ද අද ලෝකයේ විවිධ ක්ෂේත්‍රවලට පිවිසීමට ඉඩ කඩ විවර වී ඇත. යම් භික්ෂුවක් කුඩා කෙනෙක් වුවත් නියම ආකාරයෙන් සම්බුද්ධ ශාසනයෙහි හැසිරෙන්නේ නම් හෙතෙම පූර්ණ චන්ද්‍රයා සේ බබලන බව අපි තේරුම් ගනිමු. පුංචි වුණත් අපටත් ලෝකයට ම විවර වීමට අවස්ථාව ඇති බව තරයේ සිතට ගනිමු.

වෙනස් වෙමින් පවතින ලෝකයට මුහුණ දෙමින් තම යුතුකම් හා වගකීම් සමාජ ගත කිරීමේ දී වත්මන් භික්ෂූන් වහන්සේට හිමිවන්නේ සුවිශේෂී කාර්යභාරයක් බව අපි කිසිසේත් අමතක නොකරමු.

ඒ සඳහා විශේෂයෙන් භූගෝල විද්‍යා විෂයයට අදාළ නිපුණතා හා නිපුණතා මට්ටම් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාට වඩාත් වැදගත් වන ආකාරයෙන් සකස් වී තිබීම මහත් සැනසිල්ලකට කරුණකි. පරිසරය හා මිනිසා අතර සම්බන්ධතාව හදාරණ විෂයයක් ලෙසත්, පෘථිවි ගෝලයේ ස්ථානගත පිහිටීම හා වේලාව දැක්වීම සඳහා ඇති ක්‍රමවේද අධ්‍යයන කිරීමටත් මේ තුළින් ඉඩප්‍රස්ථා ලැබී ඇත.

අද පිරිවෙණ තුළ ඉගෙනුම ලබන ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ජාතික උරුමයන් පිළිබඳ අවබෝධය, බහුවාර්ගික සමාජයක සාමාජිකයන් වශයෙන් ජීවත්වීම, යුක්තිය හා සාධාරණය පිළිබඳ හැඟීම, සමාජ සම්බන්ධතා ආදිය පරිසරය හා බැඳුණු නිපුණතා යටතේ හදරති. එසේ ම සජීවී ලෝකයේ ජෛව පද්ධතිය හා මිනිස් ජීවිත අතර සම්බන්ධය පිළිබඳ අවබෝධය ද ලබා ගනිති. එය භික්ෂුවගේ ඥාණාලෝකයේ නිම්වළලු පුළුල් වීමකි. ඥාණාලෝකයෙන් ප්‍රඥාලෝකය විවර කරගැනීම භික්ෂුවගේ පරමාර්ථයයි.

අද ථේරවාදී භික්ෂුවට ලෝකයේ හිමිවන්නේ අද්විතීය ස්ථානයකි. බුදු දහම ලෝකයට ගෙන යන සුවිශේෂී දහම් වාහකයාණෝ උන්වහන්සේ ය. එබැවින් විශ්ව දැනුම උන්වහන්සේට අත්‍යවශ්‍යයම ය. අනාගත, සාර්ථක ධර්ම දූතයාණන් වහන්සේලා බිහිවන්නේ මෙලෙස බව අපි අමතක නොකරමු.

ජයසේන ගුණවර්ධන,
විෂය උපදේශක (පිරිවෙන්),
පිරිවෙන් අධ්‍යාපන ශාඛාව,
අධ්‍යාපන අමාත්‍යාංශය.

# විෂය අධ්‍යයනයේ අරමුණු
## (3, 4, 5 ශ්‍රේණි)

1. පරිසරය හා මිනිසා අතර සබඳතාව හදාරන විෂයක් ලෙස භූගෝල විද්‍යාව විෂය අධ්‍යයනය කිරීම

2. භෞතික හා මානුෂ භූ දර්ශනයේ සංරචක ගති ලක්ෂණ හා ක්‍රියාවලි පිළිබඳ අවබෝධයෙන් ක්‍රියා කිරීම

3. සෞරග්‍රහ මණ්ඩලයේ ස්වභාවය හා එහි ක්‍රියාකාරීත්වය විමර්ශනය කිරීම

4. ශ්‍රී ලංකාවේ දේශගුණික විශේෂත්වය අගය කිරීම

5. ශ්‍රී ලංකාවේ ස්වාභාවික සම්පත් හඳුනා ගැනීම

6. තමා ජීවත්වන ලෝකයේ විවිධත්වය තේරුම් ගෙන, එකිනෙකා සමඟත්, පරිසරය සමගත් සුසංයෝගීව ජීවත් වීමට හුරුවීම

7. ජීවිතයේ අභියෝගාත්මක අවස්ථා ජය ගැනීමට උපකාරී වන සුවිශේෂී ජීවිත ආරක්ෂා කර ගැනීමේ කුසලතා වර්ධනය කර ගැනීම

8. භූගෝලීය තොරතුරු ව්‍යාප්තිය නිරූපණය හා ඉදිරිපත් කිරීම සඳහා සිතියම් භාවිත කිරීමට හුරුවීම

9. දත්ත හා තොරතුරු රැස් කිරීම, විශ්ලේෂණය කිරීම, අර්ථ නිරූපණය හා ඉදිරිපත් කිරීම සඳහා භූගෝල විද්‍යාත්මක ක්‍රම ශිල්ප භාවිතයට හුරුවීම

10. වැඩ ලෝකයට සක්‍රීය ලෙස සහභාගී වීමට අවශ්‍ය කුසලතා වර්ධනය කිරීම

# මූලික පිරිවෙන් විෂය නිර්දේශය - භූගෝල විද්‍යාව -3 ශ්‍රේණිය

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලපරිච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 01. භූගෝල විද්‍යාව විෂයයේ ස්වභාවය සහ එය ඉගැනීමේ ප්‍රයෝජන අවබෝධ කර ගනියි. | 1.1 පරිසරය සහ මිනිසා අතර පවතින සබඳතාවය හදාරන විෂයක් ලෙස භූගෝල විද්‍යාව හඳුන්වයි<br>1.2 විෂය ඉගෙනීමේ ප්‍රයෝජන තේරුම් කරයි.<br>1.3 තම පිරිවෙණ/පන්සල පිහිටි පරිසරය විමර්ශනය කරයි. | • භූගෝල විද්‍යාව හැඳින්වීම.<br>• පරිසරය හා මිනිසා අතර සම්බන්ධය<br>• භූගෝල විද්‍යාවේ උප විෂය ක්ෂේත්‍ර<br>• භූගෝල විද්‍යාව ඉගෙනීමේ ප්‍රයෝජන<br>• පිරිවෙණ / පන්සල අවට පරිසරයේ පිහිටීම<br>• භෞතික හා සංස්කෘතික පරිසරයේ සම්බන්ධතා (ස්වභාවය) | • භූගෝල විද්‍යාව විෂය යනු කුමක්දැයි සරලව හඳුන්වයි.<br>• භූගෝල විද්‍යාව විෂයට අයත් විෂය ක්ෂේත්‍ර නම් කරයි.<br>• භූගෝල විද්‍යාව විෂය ඉගෙනීමේ ප්‍රයෝජන දක්වයි.<br>• තම පිරිවෙණ/පන්සල පිහිටි පරිසරයේ ස්වභාවය විස්තර කරයි. | 05 |
| 02. පෘථිවියේ භෞතික භූ දර්ශනයේ සංරචක, ගති ලක්ෂණ හා ක්‍රියාවලි විමර්ශනය කරයි. | 2.1 පෘථිවි ගෝලයේ ක්‍රියාකාරිත්ත්වය විස්තර කරයි.<br>2.2 පෘථිවි පද්ධතියේ ස්වභාවය පැහැදිලි කරයි.<br>2.3 පෘථිවි පද්ධතිවල ව්‍යුහය හා ගතික ස්වභාවය පැහැදිලි කරයි.<br>2.4 පෘථිවියේ සංයුතිය ඉදිරිපත් කරයි.<br>2.5 පෘථිවි ගෝලයේ ස්ථානගත පිහිටීම හා වේලාව දැක්වීම සඳහා ඉදිරිපත් කර ඇති ක්‍රම වේද විමර්ශනය කරයි. | • පෘථිවි ගෝලයේ ක්‍රියාකාරිත්ත්වය<br>• පෘථිවියේ භ්‍රමණය හා පරිභ්‍රමණය<br>• පෘථිවියේ පද්ධති (ශිලා, ජල, වායු, ජෛව ගෝල)<br>• පෘථිවි පද්ධතිවල ව්‍යුහය හා ගතික ස්වභාවය (පෘෂ්ඨය, ප්‍රාවරණය, හරය)<br>• පෘථිවියේ සංයුතිය<br>• පෘථිවියේ ස්ථානගතවීම හා වේලාව දැක්විය හැකි ක්‍රමවේද<br>○ අක්ෂාංශ හා දේශාංශ<br>○ ස්ථානීය හා සම්මත වේලාව ගණනය කිරීම | • පෘථිවි ක්‍රියාකාරිත්ත්වය විස්තර කරයි.<br>• පෘථිවි පද්ධතිය හඳුන්වයි.<br>• පෘථිවියට අයත් පද්ධති නම් කරයි.<br>• ඒවායේ ගතික ස්වාභාවය හා ව්‍යුහය දක්වයි.<br>• පෘථිවියේ ව්‍යුහය රූප සටහන් ඇසුරින් දක්වයි.<br>• පෘථිවියේ සංයුතිය විස්තර කරයි.<br>• අක්ෂාංශ හා දේශාංශ යනු මනඃකල්පිත රේඛා බව විස්තර කරයි.<br>• පෘථිවි ගෝලයේ විවිධ ස්ථානවල පිහිටීම නිදසුන් ඇසුරින් දක්වයි.<br>• දේශාංශගත පිහිටීම අනුව ස්ථානීය වේලාව හා සම්මත වේලාව ගණනය කිරීමේ හැකියාව ලබයි. | 14 |
| 03. පෘථිවි පද්ධතිවල ස්වාභාවය හා ක්‍රියාවලි මගින් මිනිසාට ජීවත්වීම සඳහා සුදුසු පරිසරයක් නිර්මාණය වී ඇති ආකාරය පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරයි. | 3.1 පෘථිවියේ සුවිශේෂත්වය ජීවයේ පැවැත්මට උපකාරී වන ආකාරය විමර්ශනය කරයි.<br>3.2 පෘථිවියේ ප්‍රධාන භෞතික ලක්ෂණවල විවිධත්වය විමර්ශනය කරයි. | • පෘථිවියේ සුවිශේෂත්වය ද පිහිටීම (මධ්‍යගත)<br>○ භ්‍රමණය හා පරිභ්‍රමණය (දිවා රාත්‍රී ඇතිවීම/ ඍතු භේදය)<br>○ මිනිස් වාසයට සුදුසු වීම (වායු ගෝලය/ජල ගෝලය)<br>• පෘථිවියේ ප්‍රධාන භෞතික ලක්ෂණ<br>○ මහාද්වීප හා සාගර<br>○ දූපත්, අර්ධද්වීප, ගංගා, මුහුදු හා විල්<br>○ කඳු වැටි, සානු, තැනිතලා, නිම්න<br>○ ලෝකයේ ස්වභාවික වෘක්ෂලතා<br>○ විශේෂිත භෞතික ලක්ෂණ ව්‍යාප්තිය ලෝක සිතියමක ලකුණු කර නම් කිරීම (මහද්වීපයට එක බැගින්) | • පෘථිවියේ සුවිශේෂී පිහිටීම විස්තර කරයි.<br>• දිවා රාත්‍රී ඇතිවීම හා ඍතු භේදය ඇතිවන ආකාරය නිදසුන් දෙමින් විස්තර කරයි.<br>• ජීවයේ පැවැත්මට සුදුසු ලක්ෂණ පෘථිවියේ පිහිටීම පිළිබඳව පැහැදිලි කරයි.<br>• පෘථිවියේ ප්‍රධාන භෞතික ලක්ෂණ නම් කරයි.<br>• පෘථිවියේ ප්‍රධාන භෞතික ලක්ෂණවල ස්වභාවය සරලව දක්වයි.<br>• භෞතික ලක්ෂණ කිහිපයක ව්‍යාප්තිය ලෝක සිතියමක ලකුණු කිරීමට හා නම් කිරීමට හැකියාව ලබයි. | 19 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලපරිච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 04. සෞරග්‍රහ මණ්ඩලයේ ස්වභාවය හා ක්‍රියාවලි පරීක්ෂා කරයි. | 4.1 විශ්වය පිළිබඳ සරලව විස්තර කරයි.<br>4.2 සෞරග්‍රහ මණ්ඩලය හා එහි ක්‍රියාකාරීත්වය විමර්ශනය කරයි.<br>4.3 අභ්‍යවකාශ ගවේෂණ ගැන තොරතුරු රැස් කරයි. | • විශ්වය හා සෞරග්‍රහ මණ්ඩලය.<br>◦ විශ්වය පිළිබඳ පැහැදිලි කිරීම<br>◦ බුදුදහම හා නවීන විද්‍යාත්මක ආකල්පවලට අදාළව<br>• සෞරග්‍රහ මණ්ඩලය හැඳින්වීම<br>◦ එහි සාමාජිකයෝ<br>◦ සූර්යයා<br>◦ ග්‍රහලෝක<br>◦ ග්‍රහක<br>◦ අභ්‍යාවකාශ ගවේෂණ | • විශ්වය හා සෞරග්‍රහ මණ්ඩලය සරලව පැහැදිලි කරයි.<br>• විශ්වය පිළිබඳ බුදුදහමේ ඉගැන්වීම් පැහැදිලි කරයි.<br>• විශ්වය පිළිබඳ නවීන විද්‍යාත්මක සොයා ගැනීම් දක්වයි.<br>• සෞරග්‍රහ මණ්ඩලයේ සාමාජිකයින් නම් කරයි.<br>• සෞරග්‍රහ මණ්ඩලයට අයත් සාමාජිකයින්ගේ ස්වභාවය හා ක්‍රියාකාරීත්වය පැහැදිලි කරයි.<br>• සෞරග්‍රහ මණ්ඩලයේ ස්වභාවය රූප සටහන් ඇසුරින් දක්වයි.<br>• අභ්‍යවකාශ ගවේෂණ පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි. | 07 |
| 05. ශ්‍රී ලංකාවේ භෞතික භූ දර්ශනය, සංරචක, ගති ලක්ෂණ විමර්ශනය කරමින් සංරක්ෂණයට යොමු වෙයි. | 5.1 ශ්‍රී ලංකාවේ පිහිටීම විස්තර කරයි.<br>5.2 ශ්‍රී ලංකාවේ භෞතික භූ දර්ශනය හා ඒවායේ වැදගත්කම පැහැදිලි කරයි.<br>5.3 ශ්‍රී ලංකාවේ භූ විද්‍යාත්මක පසුබිම පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි. | • ශ්‍රී ලංකාව - අපේ රට<br>◦ ශ්‍රී ලංකාවේ පිහිටීම (සාපේක්ෂ හා නිරපේක්ෂ)<br>• ශ්‍රී ලංකාවේ භෞතික භූ දර්ශන හා එහි වැදගත්කම.<br>◦ වෙරළබඩ තැනිතලාව<br>◦ අභ්‍යන්තර තැන්න<br>◦ මධ්‍යම කඳුකරය<br>◦ සබරගමු සහ ගල් ඔය කඳු පන්තිය ආදියේ ව්‍යාප්තිය සුවිශේෂ ලක්ෂණ ඇසුරින්.<br>• ශ්‍රී ලංකාවේ භූමි නිර්මාණය.<br>◦ ශ්‍රී ලංකාවේ පාෂාණ (පාංශු පැතිකඩ)<br>• ශ්‍රී ලංකාවේ ආකෘති සිතියමක භෞතික භූ දර්ශනයේ ව්‍යාප්තිය ලකුණු කර නම් කරයි. | • ලෝක සිතියම හා ආදර්ශ ගෝලය ඇසුරින් ශ්‍රී ලංකාවේ සාපේක්ෂ පිහිටීම හා නිරපේක්ෂ පිහිටීම දක්වයි.<br>• ශ්‍රී ලංකාවේ පිහිටි භෞතික භූ දර්ශනය නම් කරයි.<br>• ශ්‍රී ලංකාවේ පිහිටි භෞතික භූ දර්ශනයේ වැදගත්කම නිදසුන් ඇසුරින් දක්වයි.<br>• භෞතික භූ දර්ශනයේ ව්‍යාප්තිය ශ්‍රී ලංකා සිතියමක ඇඳ දක්වයි.<br>• ශ්‍රී ලංකාවේ භූමි නිර්මාණය පිළිබඳ අදහස් දක්වයි.<br>• ශ්‍රී ලංකාවේ ඇති පාෂාණ වර්ග නම් කරයි.<br>• ශ්‍රී ලංකාවේ පාෂාණවල පිහිටීම සිතියමක් ඇසුරින් දක්වයි.<br>• පාංශු පැතිකඩක් ඇසුරින් පසෙහි පිහිටි ස්වභාවය විස්තර කරයි. | 07 |
| 06. භූගෝලීය තොරතුරු නිරූපණය හා ඉදිරිපත් කිරීම සඳහා සිතියම් භාවිත කරයි. | 6.1 සිතියමක් යනු කුමක්දැයි අර්ථ දක්වයි.<br>6.2 සිතියමක මූලිකාංග හඳුන්වයි.<br>6.3 සිතියමක භූගෝලීය ලක්ෂණ පැහැදිලි කරයි.<br>6.4 විවිධ සිතියම් වර්ග ඇති බව නිදසුන් මගින් විස්තර කරයි. | • සිතියම හැඳින්වීම (ත්‍රිමාණ ලක්ෂණ ද්විමාණ හැඩයෙන් ඇඳ දැක්වීම)<br>• සිතියමක මූලික අංග (පරිමාණය, දිසාව, සූචකය)<br>• සිතියමක භූගෝලීය ලක්ෂණ<br>• විවිධ සිතියම් වර්ග | • සිතියම යන්න හඳුන්වයි.<br>• සිතියමක මූලික අංග නම් කරයි.<br>• සිතියමක මූලික අංග ඇඳ දක්වයි.<br>• සිතියමක භූගෝලීය ලක්ෂණ හඳුනාගෙන පැහැදිලි කරයි.<br>• සිතියම් පොත් ඇසුරින් විවිධ සිතියම් වර්ග වලට නිදසුන් ඉදිරිපත් කරයි. | 13 |

# මූලික පිරිවෙන් විෂය නිර්දේශය - භූගෝල විද්‍යාව -4 ශ්‍රේණිය

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලපරිච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 01. කාලගුණයේ හා දේශගුණයේ මූලිකාංග හඳුනා ගනිමින් ඊට අනුගත වේ. | 1.1 කාලගුණය හා දේශගුණය හඳුන්වයි.<br>1.2 කාලගුණයේ මූලිකාංග පැහැදිලි කරයි.<br>1.3 දේශගුණය පාලනය කරන සාධක විස්තර කරයි.<br>1.4 දෛනික කාලගුණික තොරතුරු රැස්කර ඉදිරිපත් කරයි. | • කාලගුණය හා දේශගුණය හැඳින්වීම<br>• දේශගුණික අංග (උෂ්ණත්වය, වර්ෂාපතනය, වායු පීඩනය හා සුළං ආර්ද්‍රතාව)<br>• දේශගුණය පාලන සාධක (අක්ෂාංශගත පිහිටීම, මුහුදේ සිට ඇති දුර)<br>• කාලය හා අවකාශය අනුව දේශගුණික වෙනස්කම්.<br>• බුදු දහමේ ඉගැන්වීම අනුව දේශගුණය මිනිසා කෙරෙහි බලපාන ආකාරය | • කාලගුණය හා දේශගුණය හඳුන්වයි.<br>• දේශගුණික අංග නම්කර හඳුන්වයි.<br>• දේශගුණය පාලනය කරන සාධක නිදසුන් දෙමින් පැහැදිලි කරයි.<br>• කාලීනව හා අවකාශීය ප්‍රදේශ අනුව සිදුවන දේශගුණික වෙනස්කම් දක්වයි.<br>• දේශගුණය මිනිසා කෙරෙහි බලපාන ආකාරය බෞද්ධ ඉගැන්වීම් ඇසුරින් විස්තර කරයි. | 14 |
| 02. ගෝලීය දේශගුණික ව්‍යාප්තිය අධ්‍යයනය කරයි. | 2.1 ලෝකයේ විවිධ දේශගුණික කලාප ඇසුරින් දේශගුණික විවිධත්වය පැහැදිලි කරයි.<br>2.2 ලෝක දේශගුණික විවිධත්වය තුළ මානුෂ කටයුතු විමර්ශනය කරයි. | • දේශගුණික කලාප බෙදා දැක්වීම හා එහි ව්‍යාප්තිය, විශේෂ ලක්ෂණ<br>○ නිවර්තන දේශගුණය<br>○ සෞම්‍ය දේශගුණය<br>○ ශීත දේශගුණය<br>• විවිධ දේශගුණික කලාපවල මානුෂ කටයුතු.<br>• අදාළ දේශගුණික කලාප ලෝක සිතියමක ලකුණු කර නම් කිරීම. | • ලෝකයේ දේශගුණික කලාප දක්වයි.<br>• දේශගුණික කලාපවල විශේෂිත ලක්ෂණ පැහැදිලි කරයි.<br>• දේශගුණික විවිධත්වය අනුව මානුෂ කටයුතු වෙනස් වන ආකාරය විස්තර කරයි.<br>• ලෝකයේ දේශගුණික කලාපවල ව්‍යාප්තිය සිතියමක ලකුණු කර නම් කරයි. | 12 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලපරිච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 03. ශ්‍රී ලංකාවේ දේශගුණ විශේෂත්වය අගය කරයි. | 3.1 ශ්‍රී ලංකාවේ දේශගුණයේ කාලීන හා අවකාශීය වෙනස්කම් අධ්‍යයනය කරයි.<br>3.2 ශ්‍රී ලංකාවට වර්ෂාව ලැබෙන ක්‍රම විමර්ශනය කරයි.<br>3.3 ශ්‍රී ලංකාවේ දේශගුණ කලාපවල වෙනස්කම් තොරතුරු ඇසුරින් පැහැදිලි කරයි. | ● ශ්‍රී ලංකාවේ දේශගුණය, ව්‍යාප්තිය හා ලක්ෂණ<br>● ශ්‍රී ලංකාවේ උෂ්ණත්ව ව්‍යාප්තිය<br>● ශ්‍රී ලංකාවේ වර්ෂාපතනය<br>○ සංවහන වර්ෂාව<br>○ මෝසම් වර්ෂාව<br>○ වාසුලි හෙවත් අවපාත<br>● ශ්‍රී ලංකාවේ දේශගුණික කලාප (ආකෘති සිතියමක ලකුණු කර නම් කිරීම.<br>● ශ්‍රී ලංකාවේ දේශගුණය සම්බන්ධව මෑත කාලීනව දක්නට ලැබෙන සුවිශේෂ ලක්ෂණ හා ඊට බලපෑ හේතු | ● ශ්‍රී ලංකාවේ දේශගුණයේ ස්වභාවය දක්වයි.<br>● ශ්‍රී ලංකාවේ උෂ්ණත්ව ව්‍යාප්තිය විස්තර කරයි.<br>● ශ්‍රී ලංකාවේ වර්ෂාපතන ස්වරූපය හා වර්ෂාව ලංකාවේ ලැබෙන ක්‍රම පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.<br>● ශ්‍රී ලංකාවේ දේශගුණයේ මෑත කාලීනව සිදු වී ඇති වෙනස්කම් ඉදිරිපත් කරයි. | 12 |
| 04. ජීවීන්ගේ පැවැත්ම සඳහා ප්‍රයෝජනවත් වන ස්වාභාවික සම්පත් හඳුනා ගැනීම හා ව්‍යාප්තිය පිළිබඳ අවබෝධයෙන් ක්‍රියා කිරීම. | 4.1 පෘථිවියේ ස්වාභාවික සම්පත් විමර්ශනය කරයි.<br>4.2 ස්වාභාවික සම්පත් සංරක්ෂණයේ අවශ්‍යතාව පැහැදිලි කරයි. | ● ලෝකයේ ස්වාභාවික සම්පත් හැඳින්වීම.<br>○ පාෂාණ (ආග්නේය, අවසාදිත, විපරීත)<br>○ ඛණිජ සම්පත්<br>○ පස<br>○ වනාන්තර<br>○ ජල සම්පත්<br>○ වායු ගෝලය සම්පතක් ලෙස<br>● ස්වාභාවික සම්පත් සංරක්ෂණය කිරීමේ අවශ්‍යතාව<br>▸ ස්වාභාවික සම්පත්වල ව්‍යාප්තිය ලෝක සිතියමක ලකුණු කර නම් කිරීම. | ● ස්වාභාවික සම්පත් යන්න හඳුන්වයි.<br>● ස්වාභාවික සම්පත් කිහිපයක් නම් කරයි.<br>● ස්වාභාවික සම්පත්වල ව්‍යාප්තිය ලෝක සිතියම් ඇසුරින් දක්වයි.<br>● ස්වාභාවික සම්පත් සංරක්ෂණයේ අවශ්‍යතාව අවධාරණය කරයි. | 14 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලපරිච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 05. ශ්‍රී ලංකාවේ ස්වාභාවික සම්පත් පිළිබඳ අවබෝධයෙන් යුතුව ක්‍රියා කරයි. | 5.1 ශ්‍රී ලංකාවේ ස්වාභාවික සම්පත් විමර්ශනය කරයි.<br>5.2 ස්වාභාවික සම්පත් සංරක්ෂණය කිරීමේ වැදගත්කම පැහැදිලි කරයි. | • ශ්‍රී ලංකාවේ ස්වාභාවික සම්පත් හැඳින්වීම.<br>○ භූමිය සම්පතක් ලෙස<br>○ පාෂාණ හා ඛණිජ සම්පත් ව්‍යාප්තිය<br>○ පස හා පසෙහි ව්‍යාප්තිය<br>○ ස්වාභාවික වෘක්ෂලතා කලාප<br>○ වන විනාශය හා වන සංරක්ෂණය<br>○ ජල සම්පත් හා ජල පෝෂක ප්‍රදේශ<br>○ ජල දූෂණය හා ජල සංරක්ෂණය<br>• ස්වාභාවික සම්පත් සංරක්ෂණය කිරීමේ වැදගත්කම හා ඒ පිළිබඳ බෞද්ධ ඉගැන්වීම්<br>• ශ්‍රී ලංකාවේ ආකෘති සිතියමක ස්වාභාවික සම්පත්වල ව්‍යාප්තිය ලකුණු කර නම් කිරීම. | • ශ්‍රී ලංකාවේ ස්වාභාවික සම්පත් නම් කරයි.<br>• ශ්‍රී ලංකාවේ ස්වාභාවික සම්පත්වල ව්‍යාප්තිය දක්වයි.<br>• ශ්‍රී ලංකාවේ ස්වාභාවික සම්පත් සංරක්ෂණයේ වැදගත්කම අවධාරණය කරයි.<br>• ස්වාභාවික සම්පත් සංරක්ෂණය පිළිබඳ තොරතුරු බෞද්ධ ඉගැන්වීම් ඇසුරින් ඉදිරිපත් කරයි.<br>• ශ්‍රී ලංකාවේ ස්වාභාවික සම්පත්වල ව්‍යාප්තිය ලකුණු කර නම් කරයි. | 13 |
| 06. ශ්‍රී ලංකාවේ 1:50,000 භූ ලක්ෂණ සිතියම් අධ්‍යයනය කරයි. | 6.1 ශ්‍රී ලංකාවේ 1:50,000 සිතියම් හඳුන්වයි.<br>6.2 ශ්‍රී ලංකාවේ භූ ලක්ෂණ සිතියම්වල මූලිකාංග පැහැදිලි කරයි.<br>6.3 1:50000 භූ ලක්ෂණ සිතියමක භෞතික හා සංස්කෘතික ලක්ෂණ නිරූපණය කරයි. | • 1:50,000 භූ ලක්ෂණ සිතියම හැඳින්වීම.<br>• භූ ලක්ෂණ සිතියමක මූලිකාංග.<br>• භූ ලක්ෂණ සිතියමක භෞතික ලක්ෂණ නිරූපණය කිරීම.<br>• භූ ලක්ෂණ සිතියමක සංස්කෘතික ලක්ෂණ නිරූපණය කිරීම. | • 1:50,000 භූ ලක්ෂණ සිතියම යනු කුමක්දැයි හඳුන්වන්න.<br>• භූ ලක්ෂණ සිතියමක මූලිකාංග දක්වයි.<br>• භූ ලක්ෂණ සිතියමක තිබෙන භෞතික ලක්ෂණ හා සංස්කෘතික ලක්ෂණ හඳුනාගෙන නිරූපණය කරයි. | 9 |

# මූලික පිරිවෙන් විෂය නිර්දේශය - භූගෝල විද්‍යාව -5 ශ්‍රේණිය

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලපරිච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 01. ලෝක ජන සංඛ්‍යාවේ ස්වභාවය අධ්‍යයනය කරයි. | 1.1 ලෝක ජන සංඛ්‍යාව අධ්‍යයනය කිරීමේ වැදගත්කම පැහැදිලි කරයි.<br>1.2 ලෝක ජන සංඛ්‍යාවේ ප්‍රධාන ලක්ෂණ පරීක්ෂා කරයි. | ● ලෝක ජන සංඛ්‍යාව අධ්‍යයනය කිරීමේ වැදගත්කම<br>● ලෝක ජන සංඛ්‍යාවේ ප්‍රධාන ලක්ෂණ<br>○ ප්‍රමාණය<br>○ ව්‍යාප්තිය<br>○ වර්ධනය<br>○ වයස් අනුව ජන ව්‍යාප්තිය<br>○ ශ්‍රම වෙළඳපොළට වයස් ව්‍යාප්තියේ බලපෑම<br>○ ජන සංක්‍රමණ හා ඊට හේතු<br>● ලෝක සිතියමක ජන සංඛ්‍යා ව්‍යාප්තිය ලකුණු කර නම් කිරීම. | ● ලෝක ජන සංඛ්‍යාව පිළිබඳ අධ්‍යයනය කිරීමේ වැදගත්කම කියයි.<br>● ලෝක ජන සංඛ්‍යාවේ ප්‍රධාන ලක්ෂණ විස්තර කරයි.<br>● ලෝක ජන සංඛ්‍යා ව්‍යාපෘතිය ලෝක සිතියමක ලකුණු කර නම් කරයි.<br>● ලෝක ජන සංඛ්‍යාවේ ප්‍රධාන ලක්ෂණවලට අදාළ වගු සටහන් ඉදිරිපත් කරයි. | 08 |
| 02. ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යාවේ ස්වභාවය අධ්‍යයනය කරයි. | 2.1 ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යාවේ ප්‍රධාන ලක්ෂණ පරීක්ෂා කරයි.<br>2.2 ශ්‍රී ලංකා ජන සංඛ්‍යාවේ නව ප්‍රවණතා විමර්ශනය කරයි. | ● ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යාව.<br>○ ප්‍රමාණය<br>○ ව්‍යාප්තිය (පළාත්, දිස්ත්‍රික් අනුව)<br>○ සංයුතිය (ජාති, ආගම්, ස්ත්‍රී පුරුෂ, වයස)<br>○ වර්ධනය, වෙනස්වීම්, සංක්‍රමණ රටා<br>● ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යාවේ නව ප්‍රවණතා<br>○ ජන සංඛ්‍යාව වියපත් වීම<br>○ නාගරික ජන සංඛ්‍යාව වැඩිවීම<br>○ සාඵල්‍යතාව අඩුවීම.<br>● ශ්‍රී ලංකාවේ ජන ව්‍යාප්තිය සිතියම්වල ලකුණු කර නම් කරීම. | ● ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යාවේ ප්‍රධාන ලක්ෂණ විස්තර කරයි.<br>● ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යාවේ නව ප්‍රවණතා නිදසුන් ඇසුරින් දක්වයි.<br>● ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යාවේ ව්‍යාප්තිය (ප්‍රදේශ, ජාති, ආගම්) සිතියම්ගත කරයි.<br>● ජන සංඛ්‍යාව හා සම්බන්ධ තොරතුරු ප්‍රස්තාර, වගු ඇසුරින් ඉදිරිපත් කරයි. | 08 |
| 03. ලෝකයේ ප්‍රධාන කෘෂිකාර්මික ක්‍රම පිළිබඳව අවබෝධ කරගනියි. | 3.1 ලෝකයේ ප්‍රධාන කෘෂිකාර්මික ක්‍රමවල ප්‍රධාන ලක්ෂණ ව්‍යාප්තිය හා විශේෂිත ලක්ෂණ පරීක්ෂා කරයි. | ● ලෝකයේ ආර්ථික කටයුතු.<br>● ලෝකයේ ප්‍රධාන කෘෂිකාර්මික භූමි පරිභෝග වර්ග<br>○ ධාන්‍ය වගාව (වී, තිරිඟු)<br>○ ව්‍යාපාරික කිරි පට්ටි පාලනය<br>○ වතු කෘෂිකර්මය (තේ, රබර්)<br>● ලෝක ආකෘති සිතියම්වල මේවා ලකුණු කර නම් කරීම. | ● ලෝකයේ ආර්ථික කටයුතු කිහිපයක් නම් කරයි.<br>● නම් කරන ලද ආර්ථික කටයුතුවල ප්‍රධාන ලක්ෂණ විස්තර කරයි.<br>● ඒ ඒ වගාවල ව්‍යාප්තිය, ප්‍රයෝජන චාට් සටහන් ඇසුරින් ඉදිරිපත් කරයි. | 10 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම්පල | කාලපරිච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 04. ලෝකයේ නිෂ්පාදන කර්මාන්තවල ප්‍රධාන ලක්ෂණ පරීක්ෂා කරයි. | 4.1 ලෝකයේ තෝරාගත් නිෂ්පාදන කර්මාන්ත කිහිපයක ප්‍රධාන ගති ලක්ෂණ විමර්ශනය කරයි. | ● ලෝකයේ තෝරාගත් නිෂ්පාදන කර්මාන්ත කිහිපයක ගති ලක්ෂණ.<br>○ ඇඟලුම් කර්මාන්තය<br>○ යකඩ හා වානේ කර්මාන්තය<br>○ මෝටර් රථ කර්මාන්තය<br>○ විද්‍යුත් කර්මාන්තය (ඉලෙක්ට්‍රොනික/පරිගණක)<br>○ ගුවන් යානා තැනීමේ කර්මාන්තය<br>● ලෝක ආකෘති සිතියම්වල මේවා ලකුණු කර නම් කිරීම. | ● ලෝකයේ නිෂ්පාදන කර්මාන්ත කිහිපයක් නම් කරයි.<br>● නම් කරන ලද නිෂ්පාදන කර්මාන්ත කිහිපයක ලක්ෂණ පරීක්ෂා කරයි.<br>● නිෂ්පාදන කර්මාන්තවල ව්‍යාප්තිය ලෝක සිතියමක ලකුණු කර නම් කරයි.<br>● ඒ ඒ කර්මාන්තවල ව්‍යාප්තිය, වැදගත්කම, නිශ්පාදන ආදී අංශවල තොරතුරු වගුගත කිරීම, ප්‍රස්තාර සටහන්වලින් දැක්වීම සිදු කරයි. | 09 |
| 05. ශ්‍රී ලංකාවේ ප්‍රධාන කෘෂිකාර්මික භූමි පරිභෝග වර්ග හා කර්මාන්ත පිළිබඳ අධ්‍යයනය කරයි. | 5.1 ශ්‍රී ලංකාවේ ප්‍රධාන කෘෂිකාර්මික භූමි පරිභෝග වල ස්වභාවය හා ගැටලු දක්වයි. | ● ශ්‍රී ලංකාවේ ආර්ථික කටයුතු<br>● ශ්‍රී ලංකාවේ ප්‍රධාන කෘෂිකාර්මික භූමි වර්ග හා ගැටලු<br>○ යැපුම් කෘෂිකර්මය (වී හා හේන් වගාව)<br>○ වාණිජ කෘෂිකර්මය (තේ, රබර්, පොල් හා සුළු අපනයන භෝග)<br>○ ධීවර කර්මාන්තය (අභ්‍යන්තර හා මුහුදු)<br>● ශ්‍රී ලංකාවේ තෝරා ගත් කර්මාන්ත කිහිපයක ගති ලක්ෂණ හා ගැටලු<br>○ කෘෂිපාදක කර්මාන්තය (තේ, පොල්, රබර් ආශ්‍රිත සැකසුම්)<br>○ ඇඟලුම්, කඩදාසි කර්මාන්ත<br>○ ආකර හා පතල් කැනීම්<br>○ ආහාර හා පාන වර්ග<br>○ විද්‍යුත් කර්මාන්තය<br>○ සේවා කර්මාන්තය (සංචාරක, සන්නිවේදන).<br>▸ ලංකා ආකෘති සිතියම්වල මේවා ලකුණු කර නම් කිරීම. | ● ශ්‍රී ලංකාවේ ආර්ථික කටයුතු කිහිපයක් නම් කරයි.<br>● ශ්‍රී ලංකාවේ ප්‍රධාන කෘෂිකාර්මික භූමි පරිබෝග වර්ග උදාහරණ ඇසුරින් පැහැදිලි කරයි.<br>● ශ්‍රී ලංකාවේ කෘෂිපාදක කර්මාන්ත පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.<br>● ශ්‍රී ලංකාවේ කර්මාන්තවල ව්‍යාප්තිය ලකුණු කර නම් කරයි.<br>● යහපත් කර්මාන්තයක නිරතවීමෙන් අත්වන ප්‍රතිඵල සාකච්ඡා කරයි.<br>● අදාළ තොරතුරු වගුගත කර ඉදිරිපත් කරයි. | 13 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලපරිච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 06. ස්වභාවික උපද්‍රව හා ඒවායේ ක්‍රියාකාරීත්වය පිළිබඳ අවබෝධයක් ලබා ගනී. | 6.1 ස්වභාවික උපද්‍රවය හා ආපදාව හඳුන්වයි.<br>6.2 ශ්‍රී ලංකාවේ ස්වභාවික උපද්‍රව හා ක්‍රියාකාරීත්වය පිළිබඳ තොරතුරු විමර්ශනය කරයි.<br>6.3 ආපදා කළමණාකරණය පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරයි. | ● ස්වභාවික උපද්‍රවය හා ආපදා හැඳින්වීම.<br>● ස්වභාවික උපද්‍රව<br>◦ භූමි කම්පා<br>◦ ජල ගැලීම්<br>◦ සුනාමි<br>◦ වා සුළි<br>◦ ලැව් ගිනි<br>◦ නියඟ<br>◦ නාය යෑම්<br>◦ අකුණු<br>● ස්වාභාවික විපත් බහුලව සිදුවන ආපදා කළමනාකරණය<br>● විශේෂිත ස්ථාන ලෝක සිතියමක ලකුණු කර නම් කිරීම. | ● ස්වභාවික උපද්‍රව හා ආපදා අතර වෙනස දක්වයි.<br>● ශ්‍රී ලංකාවට බලපාන ස්වභාවික උපද්‍රව විස්තර කරයි.<br>● ආපදා කළමනාකරණය පිළිබඳ අවබෝධයෙන් කරුණු ඉදිරිපත් කරයි.<br>● ව්‍යසන ආශ්‍රිත තොරතුරු වගුගත කර ඉදිරිපත් කරයි.<br>● ව්‍යසන ඇතිවූ/ ඇතිවන අදාළ තොරතුරු හා සම්බන්ධ ස්ථාන සිතියම්වල ලකුණු කර නම් කරයි. | 04 |
| 07. තිරසාර සංවර්ධනය පිළිබඳ ධනාත්මක ආකල්ප සහිතව හැසිරෙයි. | 7.1 ජීවන දර්ශනයක් වශයෙන් තිරසාර සංවර්ධන පිළිපැදීමේ අවශ්‍යතාව පැහැදිලි කරයි.<br>7.2 ශ්‍රී ලංකාවේ පරිසර සංරක්ෂණය පිළිබඳ ඇති ගැටලු විමර්ශනය කරයි. | ● පරිසර ආචාර ධර්ම හා සංවර්ධනය<br>◦ මිනිසා පරිසරය ප්‍රයෝජනයට ගන්නා ආකාරය<br>◦ පරිසර ආචාර ධර්ම යනු කවරේද?<br>● තිරසාර සංවර්ධනය<br>◦ පරිසර සංරක්ෂණ පනත්, සංවිධාන හා ආයතන<br>◦ ශ්‍රී ලංකාවේ පරිසර සංරක්ෂණ පනත් | ● මිනිසා හා පරිසරය අතර සම්බන්ධතාවය විස්තර කරයි.<br>● පරිසර ආචාර ධර්ම හඳුන්වා ඒවා විස්තර කරයි.<br>● තිරසාර සංවර්ධනය පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.<br>● තිරසර සංවර්ධනයක අවශ්‍යතාව පැහැදිලි කරයි.<br>● අදාළ තොරතුරු වගුගත කර ඉදිරිපත් කරයි. | 12 |
| 08. දත්ත හා තොරතුරු විශ්ලේෂණය කිරීමට, අර්ථ නිරූපණය හා ඉදිරිපත් කිරීම සඳහා සිතියම් විද්‍යාවේ පවතින ක්‍රම ශිල්ප භාවිත කරයි. | 8.1 1:50,000 භූ ලක්ෂණ සිතියමක තොරතුරු විවරණය කරයි.<br>8.2 විවිධ විද්‍යාත්මක ක්‍රම ශිල්පවල ඇති ප්‍රයෝජන සොයා බලයි.<br>8.3 ප්‍රස්තාර යොදා ගනිමින් දත්ත නිරූපණය කරයි. | ● 1:50,000 භූ ලක්ෂණ සිතියම් විවරණය කිරීම<br>● සිතියම් විද්‍යාත්මක ක්‍රම ශිල්ප<br>● සිතියම් විද්‍යාවේ භාවිත වන නවීන ශිල්ප ක්‍රම හඳුනාගැනීම හා ප්‍රයෝජන<br>◦ GIS<br>◦ GPS<br>● ප්‍රස්තාර භාවිතයෙන් දත්ත නිරූපණය (සරල තීරු, සරල රේඛා, වෘත්ත) | ● 1:50,000 භූ ලක්ෂණ සිතියමක භෞතික හා සංස්කෘතික ලක්ෂණ විස්තර කරයි.<br>● නව සිතියම් විද්‍යාත්මක ක්‍රම ශිල්ප නම් කරයි.<br>● නව සිතියම් විද්‍යාත්මක ක්‍රම ශිල්පවල ප්‍රයෝජන විස්තර කරයි.<br>● ප්‍රස්තාර භාවිතයෙන් දෙන ලද දත්ත නිරූපණය කර දක්වයි. | 10 |